# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,451 - 2006 ජූනි 23 වැනි සිකුරාදා - 2006.06.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 490 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 490 |
| මිල පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 492 |
| නාවියන්ට දැන්වීම් - - | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පලකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 ජූනි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 ජූනි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# වෙනත් පත්කිරීම් ආදිය

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බලසේනාව

### යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිල පහත හෙළීම්

පහත සඳහන් නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි සිට ඔවුන්ගේ ස්ථිර නිලය වන ලුතිනන් නිලයට නිල පහත හෙළීම අනුමත කර ඇත.

1. නි/3345 ලුතිනන් (තාවකාලික කපිතන්) තිසාහාමි විජයරත්න, ශ්‍රීලංඉ - 1997.06.15
2. නි/3544 ලුතිනන් (තාවකාලික කපිතන්) අහමඩ් මග්බුල් මොහොමඩ් අවුෆ්, ශ්‍රීලංඉ - 1997.05.21
3. නි/4380 ලුතිනන් (තාවකාලික කපිතන්) රූපසිංහ ආරච්චිගේ චන්දන ජයලත්, ශ්‍රීලංඉ - 2000.07.01
4. නි/3372 ලුතිනන් (තාවකාලික කපිතන්) අරඹවත්තගේ ප්‍රදීප් සුජීව රොඩ්‍රිගෝ, ශ්‍රීලවියාඉ - 2001.03.01
5. නි/3398 ලුතිනන් (තාවකාලික කපිතන්) රාජපක්ෂ මුදියන්සේලාගේ සෝමසිරි, ශ්‍රීලයුපුබ - 1998.02.28
6. නි/3539 ලුතිනන් (තාවකාලික කපිතන්) රත්නායක මුදියන්සේලාගේ ශිරාන් තුසිත බණ්ඩාර රත්නායක, ශ්‍රීලයුපොදුසේබ - 1998.03.01
7. නි/3549 ලුතිනන් (තාවකාලික කපිතන්) ප්‍රසාද් ජනප්‍රිය දේවපුර, ශ්‍රීලංඉ - 1997.09.01
8. නි/3540 ලුතිනන් (තාවකාලික කපිතන්) විමලසිරි සූරියආරච්චි, ශ්‍රීලයුපොදුසේබ - 1998.11.15
9. නි/3705 ලුතිනන් (තාවකාලික කපිතන්) හේරත් මුදියන්සේලාගේ සුජීව හේරත්, ශ්‍රීලසිරෙ - 2001.10.01
10. නි/3716 ලුතිනන් (තාවකාලික කපිතන්) වලිච්චෝරු හේවගේ චන්න ජයවීර සිල්වා, ශ්‍රීලසිරෙ - 2000.02.06
11. නි/3819 ලුතිනන් (තාවකාලික කපිතන්) සුසන්ත කීර්ති කුමාර වීරසූරිය, ශ්‍රීලපාහ - 2002.04.01
12. නි/3846 ලුතිනන් (තාවකාලික කපිතන්) බුළුගහමුල්ලේ පතිරන්නැහැලාගේ නයනානන්ද පුෂ්පකුමාර, ගරෙ - 2002.07.01

ජී. එස්. සී. ෆොන්සේකා, ආර්ඩබ්පී ආර්එස්පී ආර්සීඩීඑස් පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

06-640

---

2006 අංක 135

### දේශීය ආදායම් සමාලෝචන මණ්ඩලයට ලේකම්වරයකු පත් කිරීම

1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 118(2) වගන්තිය සහ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ 137(2) වගන්තිය යටතේ දේශීය ආදායම් කොමසාරිස්, පී. ඩී. ප්‍රේමරත්න මහතා 2006 ජූනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය වර්තමාන රාජකාරිවලට අමතරව දේශීය ආදායම් සමාලෝචන මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කර ඇත.

ලේකම්,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය.

2006 ක් වූ මැයි මස 30 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

06-612

---

# ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය : ඊඩී/1/8/1/අම්/17

### 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ) (ආ) (ඇ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ගෝමරන්කඩවල පිහිටි ශ්‍රී රතනජෝති පිරිවෙන 2005.01.01 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන අඹගස්වැවේ ඉන්ද්‍රජෝති ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3 (6)(අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වේනොත් මෙම දැන්වීම පළවී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

2006 මැයි මස 10 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, " ඉසුරුපායේ,"
අධ්‍යාපන අමාත්‍යාංශයේ, පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේදීය.

06-551/1

---

### වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

කන්දේඇල ව්‍යාපාරය - කන්න රැස්වීම් වාර්තාව

**2006 යල කන්නය - 2006.04.25 දින**

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දේඇල ව්‍යාපාරයේ යල කන්නය සඳහා 2006.04.25 දින පවත්වන ලද කන්න රැස්වීමේදී පහත සඳහන් තීරණ ගන්නා ලදී.

1. *වගා රටාව* :

1. මහ කන්නය - අක්කර 400 ක් වී වගාව
2. යල කන්නය - එළවළු වගාව

2. *ඇල වේලි ශුද්ධ කිරීම හා නඩත්තුව* :

2006.07.15 දිනට පෙර ඇලවේලි ශුද්ධ කිරීම අවසන් කිරීමට තීරණය විය. ඇල වේලි ශුද්ධ කල බවට සහතිකයක් නොමැතිනම් ජලය නිකුත් නොකිරීමට තීරණය විය. නඩත්තු සඳහා යොදා ගන්නා මැෂින් 2006.04.20 දින ඉවත් කිරීමට තීරණය විය.

3. *මුලික ජලය නිකුත් කිරීම* :

2006.07.30 දිනට නිකුත් කිරීමට තීරණය විය.

4. *විකල්ප භෝග වගාව* :

කන්දේඇල ව්‍යාපාරයට අයත් දැඩි බෑවුම් සහිත ඉඩම්වල තේ වැනි විකල්ප භෝග වගා කිරීම සුදුසු බව යෝජනා කෙරිණ.

5. *අනවසරකරුවන් ඉවත් කිරීම* :

කන්දේඇල ව්‍යාපාරයට අයත් ඇල රක්ෂිතවල අනවසරකරුවන් 175 ක් පමණ සිටින බව අනාවරණය විය. මෙම අනවසරකරුවන් ඉවත් කිරීමේ පූර්ණ බලය ගොවි සංවිධාන සතුව තිබෙන බව අවධාරණය කරන ලදී.

අනවසරකරුවන් ඉවත් කිරීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමට ප්‍රාදේශීය ලේකම්තුමා හා වාරිමාර්ග ඉංජිනේරුතුමා එකඟ විය.

ඉහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සුදුසු බව අවසාන වශයෙන් යෝජනා ස්ථිර කර සහා සම්මත කරගන්නා ලදී.

ඩබ්. එම්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්/වැලිමඩ.

2006 අප්‍රේල් මස 28 දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-568/1

---

## වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### දූඹවින්න ව්‍යාපාරය - කන්න රැස්වීම් වාර්තාව

**2006 යල කන්නය - 2006.04.25 දින**

වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දූඹවින්න ව්‍යාපාරයේ 2006 යල කන්නය සඳහා කන්න රැස්වීම 2006.04.25 දින පැවැත්විණ. එහිදී පහත සඳහන් තීරණ ගන්නා ලදී.

1. *ඇල වේලි ශුද්ධ කිරීම හා නඩත්තුව* :

කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කරන සුළු පිරිසක් නිසා ව්‍යාපාරයේ කටයුතු අවුල් සහගත තත්වයට පත්වන බවත්, එමගින් ගොවීන් අපහසුතාවයට පත්වන බවත් සාකච්ඡා කෙරිණි.

ඇලවේලි ශුද්ධ කිරීම හා නඩත්තුව සඳහා සහය නොදක්වන අය සඳහා දඩ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

දූඹවින්න ව්‍යාපාර බල ප්‍රදේශයේ පවතින ප්‍රතිසංස්කරණය කලයුතු ඇල මාර්ග පිළිබඳව ප්‍රමුඛතාවය අනුව යෝජනා සකස්කර ඉදිරිපත් කරන ලෙසත් ඉන්පසු ප්‍රතිසංස්කරණ කටයුතු ඇරඹීමටත් තීරණය විය.

02. *අනවසර වගා කිරීම්* :

අදාල ඇල රක්ෂිත මැනුම් කිරීමටත් රක්ෂිතවල අනවසරයෙන් වගා කටයුතු කරන ගොවීන් ඉන් ඉවත් කිරීම සඳහා නියෝග නිකුත් කිරීමටත් තීරණය විය.

03. *වගා කටයුතු සම්බන්ධ ඉදිරි සැලැස්ම* :

එළවළු කන්න 2 කට හා වී කන්න 1ක් සඳහා ක්‍රමෝපාය හා දින වකවානු සකස් කිරීම සඳහා ගොවි සංවිධාන සාකච්ඡා කොට ප්‍රායෝගික සැලැස්ම ඉදිරිපත් කිරීමට ගොවි සංවිධාන නිලධාරීන් එකඟවීය.

ඉහත සඳහන් තීරණ ක්‍රියාත්මක කිරීම සුදුසු බව අවසාන වශයෙන් යෝජනා ස්ථිර කර සහා සම්මත කරගන්නා ලදී.

ඩබ්. එම්. ගුණවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
වැලිමඩ.

2006 අප්‍රේල් මස 28 වැනි දින,
වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-568/2

---

## වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ 2006 වාර්ෂික ආගමික උත්සවය, 2006 අගෝස්තු මස 03 වැනි බ්‍රහස්පතින්දා දින සිට 2006 අගෝස්තු මස 16 වැනි බදාදා දින දක්වා පවත්වනු ලබන බව, වන්දනා ගමන් ආඥාපනත (175 වන පරිච්ඡේදයේ) යටතේ 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද අංක 11959 දරන *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි වල 10 වැනි වගන්තිය යටතේ මෙයින් දන්වමි.

එච්. ජී. එස්. ජයසේකර,
දිස්ත්‍රික් ලේකම්,
මාතර.

2006 ජූනි මස 07 වැනි දින,
මාතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

06-641

---

## වන්දනා පනත

මගේ අංකය : ටීකේ/ඩීඑස්/ඊඑස්ටී/ටීජී/01.

### 2006 වර්ෂයේ තිරුක්කෝවිල් ශ්‍රී සිත්තිරවේලායුද ස්වාමි කෝවිල් වාර්ෂික උත්සවය අම්පාර දිස්ත්‍රික්කයෙහි තිරුක්කෝවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මෙම දේවාලයේ 2006 වර්ෂයේ වාර්ෂික උත්සවය 2006 ක් වූ ජූලි මස 07 වැනි දින ආරම්භ වී 2006 ජූලි 24 වැනි දින දියකැපීම් සමඟ නිමාවට පත්වන බව සියලුම වන්දනාකරුවන්ට සහ අනෙකුත් අයවලුන්ට මෙයින් දන්වනු ලැබේ.

1951ක් වූ වර්ෂයේ මැයි මස 11 වැනි දිනැති අංක 10247 දරන *රජයේ ගැසට්* නිවේදනයේ සඳහන් රෙගුලාසි මෙම උත්සව සමයේදී පිළිපදින ලෙසට සියලුම වන්දනා කරුවන්ට සහ අනෙකුත් අයවලුන්ට මෙයින් දන්වනු ලැබේ.

මෙම උත්සව භූමියේ මායිම පහත සඳහන් පරිදි විශාලකර ඇති බව කරුණාවෙන් සළකන්න

*උතුර* : කෝවිල් පාර, තිරුක්කෝවිල්
*නැගෙනහිර* : ධීවර කර්මාන්ත පාර, තිරුක්කෝවිල්
*දකුණ* : මුහුදු පාර, තිරුක්කෝවිල්
*බටහිර* : ප්‍රධාන පාර, තිරුක්කෝවිල්

වී. අලගරත්නම්,
ප්‍රාදේශීය ලේකම්,
තිරුක්කෝවිල්.

2006 මැයි මස 31 වැනි දින.

06-643

---

## අලම්පිල් පුනිද අන්තොනියාර් ආලය උත්සවය - 2006

ඉහත සඳහන් උත්සවය 2006 ජූනි මස 01 වැනි දින පෙරවරු 6.00 ට පටන් ගෙන 2006 ජූනි මස 13 වැනි දින පෙරවරු 6.00 ට අවසන් වන බව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මේ පිළිබඳව 1949 මැයි 27 වැනි දින අංක 9978 හා 1950 මැයි 26 දිනැති අංක 10105 දරන රෙගුලාසිවලට පොදු ජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත්කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගු වනවා ඇත.

ඉමෙල්ඩා සුකුමාර්,
මුලතිව් දිස්ත්‍රික්කයේ දිසාපති.

2006 ක් වූ ජුනි මස 01 වැනි දින.

06-610

---

මගේ යොමු අංකය : ඊඩී/1/8/2/කො/44.

## 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වන, 27 වන සහ 33 වන වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6) (අ), (ආ), (ආ), ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

කොළඹ දිස්ත්‍රික්කයේ, නුගේගොඩ, ශ්‍රී පඤ්ඤෝදයාරාමයෙහි පිහිටි කො/ශ්‍රී පඤ්ඤෝදය මූලික පිරිවෙන 2005.03.30 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහා කෘත්‍යාධිකාරීන් වහන්සේ වෙත පූජ්‍ය සූරියවැවේ විජිතනන්ද ස්වාමීන්වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරිමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) (අ) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළවී දින තිහක් (30), ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආරියරත්න හේවගේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්,

2006 මැයි මස 24 දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, "ඉසුරුපායේ,"
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේදී ය.

06-551/2

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - මීරිගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් 2001.10.12 දින සහතික කරන ලද අංක 6413 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, මොහමඩ් ලෙබ්බේ මොහමඩ් හකීම් සහ මොහමඩ් තහා ෆාතිමා පස්නා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසීය විසි නමයයි ශත අනූපහ (රු. 2,30,229.95) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඉඩ ඇති බැවින් ද, 2004.03.12 දින සිට වර්ෂයකට 29% බැගින් රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසීය විසි නමයයි ශත අනූපහ (රු. 2,30,229.95) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙලක්ෂ තිස්දහස් දෙසීය විසි නමයයි ශත අනූපහ (රු. 2,30,229.95)ක මුදල අයකර ගැනීම සඳහා ගම්පහ බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් විසින් එකී අංක 6413 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, තිහාරිය ගම පිහිටි හොරගහවත්ත (කොටස) නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. රණසිංහ තාඹුගල විසින් 2001.07.07 වැනි දින මැන සකස් කළ අංක 5315 දරන පිඹුරේ ලොට් අංක 4 ඒ දරන කොටසට මායිම්, උතුරට : ඒ. සී. එම්. ෆාහුම් විසින් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : හිජ්රා මාවත ද, දකුණට : ලොට් 4බී ද, බස්නාහිරට : ඒ. එම්. රෆීක් විසින් හිමිකම් කියන ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හතයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 12.70) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 645/150හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශී කළමනාකාර,
ගම්පහ.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 131, නුවර පාර, බැලුම්මහර, මුදුන්ගොඩ.

06-626

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංක : 2/54035/එෆ්2/457, 2/74752/කේ2/646.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන් ඩබ්. රාජකරුණා සහ ඩබ්. එල්. ගුණතිලක විසින් සහතික කරන ලද 1994.02.14 සහ 1999.01.20 දිනැති අංක 10086 සහ 3168 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කඩවත පදිංචි හෙට්ටිතන්ත්‍රීගේ දොන් බර්නි සමන් පෙරේරා සහ කංකානිගේ සන්ධ්‍යා නිර්මලී පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ අනූපන්දහස් අටසිය හතලිස් හයයි ශත හතලිස් අට (රු. 4,95,846.48), මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 10086 සහ 3168 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අනූ පහයි ශත විසි නවයක (රු. 185.29)ක බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර. ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, මහර ප්‍රාදේශීය සහා උප කාර්යාල සීමාව තුළ කැන්දලියද්දපාලුව බන්ධනාගාර පාරේ, වරිපනම් අංක 86 දරන පෙලෙන්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. බී. එල්. ප්‍රනාන්දු විසින් සකසන ලද 1993.11.01 දින සහ අංක 1340 දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 26.1 ක් වූ කැබලි අංක 2ඒ දරන බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජුනි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාරේ,
කොළඹ 03.

06-645/7

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 19/74274/වයි19/084.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. වෙන්නප්පුව ප්‍රසිද්ධ නොතාරිස් කේ. එෆ්. ජේ. පෙරේරා විසින් සහතික කරන ලද 2003.05.26 දිනැති අංක 7773 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, ලුණුවිල පදිංචි සුබ්‍රමානියම් නල්ලයියා දාසන් *හෙවත්* සුබ්‍රමානියම් නල්ලයියා දාස යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.31 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් අනූ අටදහස් තුන්සිය දාසයක (රු. 98,316) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 7773 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් තිස් තුනයි ශත අනූව (රු. 33.90) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474, මහානාම ඩ්‍රයිව් හි බලයලත් වෙන්දේසිකාර ආර්. එස්. මහානාම මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරාවිල ලියාපදිංචි කොට්ඨාසයේ, ලුණුවිල පිහිටි කිරිමැටියාන වත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. ඩබ්. ප්‍රනාන්දු විසින් සකසන ලද 1998.03.05 දිනැති අංක 1420 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 4 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක 20 මතින් ඇති මාර්ග අයිතීන් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 ජුනි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාරේ,
කොළඹ 03.

06-645/6

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංක : 18/9009/ඩී18/456, 18/68832/වයි18/947.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිසවරුන් වන ඒ. එස්. ජේ. රොද්‍රිගෝ සහ ඩී. ජේ. පීරිස් විසින් සහතික කරන ලද, 1986.05.01 සහ 2001.10.25 දින හා අංක 359 හා 28 දරන උකස් බැඳුම්කර මත අය වියයුතු මුදල් ගෙවීම, දෙහිවල පදිංචි රංජිත් ඩයස් අබේවික්‍රම ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ හතලිස් දෙදහස් හයසිය අනූවයි ශත අසූදෙකක (රු. 4,42,690.82) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 359 සහ 28 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය තිස් හතයි ශත විස්සක (රු. 137.20) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, ගල්ලැහැර ඉහලකඩදුන්න සහ පාම්බේ පිහිටි වැවගාවහේන්යාය, පන්සලගාවහේන්යාය, සහ ඇටඹගහහේන ලෙස හැඳින්වෙන ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ගුණසේකර විසින් සකසන ලද 1965 ජුලි මස 12 - 14 දිනැති හා අංක 2462 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1, 9, 2, 10, 3, 11, 4 සහ 12 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් (අ. 1, රූ. 2, ප. 23.4/5), (අ. 0, රූ. 0, ප. 35 1/2), (අ. 1, රූ. 2, ප . 23.4/5), (අ. 0, රූ. 0, පර්. 351/2), (අ. 1, රූ. 2, ප. 23 4/5), (අ. 0, රූ. 0, ප. 35. 1/2), (අ. 1, රූ. 2, ප. 23 4/5), (අ. 0, රූ. 0, පර්. 35 1/2) ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමහ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 9/58630/ඉසඩ්9/302.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.07.10 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී.කේ. නියතපාල විසින් සහතික කරන ලද, 1996.09.12 දින හා අංක 2257 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, දික්වැල්ල පදිංචි කටපොඩි කන්කානම්ගේ කසුන් ගාවින් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2002.05.20 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් හයසිය අසූ අටයි ශත හතලිස් හයක (රු. 2,45,688.46) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2257 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසිහතරයි ශත දහතුන (රු. 124.13) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, විල්ෆ්‍රඩ් ගුණසේකර මාවත, අංක 39 හි බලයලත් වෙන්දේසිකාර එම්. එච්. පී. සිරිවර්ධන මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශී සභා සීමාවේ වත්තේගම පිහිටි සිරිවර්ධන ලියනාරච්චිගේ වත්ත නැමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදාස විසින් සකසන ලද 1994.03.10 දිනැති හා අංක 870ක් දරන මිණුම් පිඹුරේ කැබැලි අංක අට ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 0, රූඩ් 0, පර්චස් 33.9ක් වූ (මාතර දිස්ත්‍රික් උසාවියේ බෙදුම් නඩු අංක 15044 ට අනුව ඔප්පුවේ අ. 0, රූ. 0, පර්. 33.3ක් ලෙස සඳහන් වේ.) බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිට සියලු දේත් සමහ වේ.

තවද, එකී මිණුම් පිඹුරේ කැබලි අංක 9 මතින් (අඩි 10ක් පළල ) ඇති මාර්ග අයිතියද සමහ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/9

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/28095/ඩබ්6/604.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. සී. පීරිස් විසින් සහතික කරන ලද, 1996.01.26 දින හා අංක 413 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, පානදුර පදිංචි පනවන්නගේ පැට්‍රික් ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ තිස් දෙදහස් අටසිය හැටහතයි ශත හතලිස් හතක (රු. 1,32,867.47)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 413 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් පහයි ශත අසූහයක (රු. 45.86)ක බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසියේ එච්. ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර කොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ මාලමුල්ල පිහිටි අලුබෝගහවත්තේ කැබලි අංක ඩී පැලන්ගහවත්ත සහ වෙරිහෙරලිගහවත්ත හෙවත් පැලැන්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වයි. බී. එක්. කොස්තා විසින් මැන සකසන ලද 1992.09.17 දින හා අංක 2601 දරන මිනුම් පිඹුරේ කැබලි අංක ඩී 3 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමහ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/8

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981 හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 8/73787/ඉසඩ්8/608.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මතුගම ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පැස්කුවල් විසින් සහතික කරන ලද, 2003.03.06 දින හා අංක 2703 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, නවඳගල, පදිංචි තිස්ස සේනපුර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.01.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් දෙලක්ෂ අනූඑක්දහස් හත්සිය තුනයි ශත තිස්නමයක (රු. 2,91,703.39) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2703 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පහයි ශත අනූඅටක (රු. 105.98) ක් බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මාතර, කොටුව, ශ්‍රී ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතාට බලය පැවරිය යුතු වන්නේය.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, කරන්දෙණිය ප්‍රාදේශීය සභා සීමාවේ හිපන්කන්ද පිහිටි කීනගහකැලේ ඉඹුල්ගහවෙල සහ මැදදුව ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එම්. සිරිපාල විසින් සකසන ලද 2002.09.15 දින සහ අංක 2009 දරන පිඹුරේ කැබලි අංක 8 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 2, රූ. 0, පර්. 0 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුදේත් සමහ වේ.

තවද බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු විසින් සකසන ලද 1976.11.05 දිනැති හා අංක 1643 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 10 (පාර සඳහා වෙන් කළ) මතින් ඇති මාර්ග අයිතියද සමහ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 ජුනි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/5

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981 හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : 6/35119/පී6/319

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කළුතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. හෙට්ටිආරච්චි විසින් සහතික කරන ලද, 1998.08.22 දින හා අංක 690 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, පයියාගල පදිංචි වීරවර්න කුලරුකුලසූරිය බූසාබඳුගේ ශිරානි බර්නදෙත් ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ අනූදහස් අටසියයි ශත අසූහතරක (රු. 1,90,800.84) පූර්වෝක්ත බැඳුම්කර අංක 690 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හැටනවයයි ශත අටක් (රු. 69.08) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, පානදුර, ඩයස් ගොඩනැගිල්ලේ හි බලයලත් වෙන්දේසිකාර එච්.ගිල්ටන් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, දකුණු කළුතර තොටමුණේ, පයියාගල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුඩා පයියාගල පිහිටි පාරුවත්තේ එකාබද්ධ කැබලි අංක 1, 2 සහ 3 නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සෙනවිරත්න විසින් සකසන ලද 1994.08.07 දිනැති හා අංක 7569 දරන පිඹුරේ කැබලි අංක සී ලෙසින් දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 10 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

තවද, එකී පිඹුරේ මාර්ග සඳහා වෙන් කර ඇති අයිතිය සහ අනෙකුත් අයිතීන් ද, දුම්රිය මාර්ගය සඳහා වෙන් කළ කොටසට ඇති අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/1

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : ජීපී/02/02232/කේ2/890.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.03.09 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජයනි පෙරේරා විසින් සහතික කරන ලද, 2004.03.24 දින හා අංක 2388 දරන උකස් බැඳුම්කරය මත අය වියයුතු මුදල් ගෙවීම, කිඹුලාපිටිය පදිංචි මුණසිංහ ආරච්චිගේ නිමල් වික්‍රමසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2006.02.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ අනූහත්දහස් නවසිය හතලිස් හතයි ශත අනූ හතර (රු. 3,97,947.94) පූර්වෝක්ත බැඳුම්කර අංක 2388 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය විසිදෙකයි ශත විසිහය (රු. 122.26) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, ගම්පහ, උසාවිය පාර, ස. ණ. ස. චතුරශ්‍රය, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ කිඹුලාපිටිය පිහිටි මකුල්ලගහවත්ත සහ ගල්මන්කඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සැකසුණු 2003.11.22 සහ අංක 6534 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 15.5 කින් යුත් කැබලි අංක 01 දරන බිම් කොටස සහ ඊට අයත් සියලු දේත් සමඟ වේ.

තවද ජී. එල්. බී. නානායක්කාර බලයලත් මානක තැනගේ 1991.12.22 දින සහ අංක 10394 දරන පිඹුරේ කැබලි අංක යූ මතින් දක්වා ඇති අඩි 15 පළල සහ අඩි 20 පළල මාර්ග අයිතින් ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/2

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1981හි අංක 62 දරන පනතින් හා 1984 හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේයූ/18/00054/කේයූ1/36

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.01.31 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් වසන්ත අමරසේකර විසින් සහතික කරන ලද, 2003.10.27 දින හා අංක 9421 දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම, කුරුණෑගල පදිංචි උඩුවෙල මුහන්දිරම්රාලලාගේ නන්දන කුමාර විජේකෝන් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2005.12.31 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් එක්ලක්ෂ අසූතුන් දහස් පන්සිය පනස් හයයි ශත දාසයක (රු. 1,83,556.16) මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 9421 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන දිනය වනතුරු දිනකට රුපියල් හතලිස් නවයයි ශත තිස් එකක (රු. 49.31) බැගින් වැඩිපුර පොළී ද අයවිය යුතුව ඇති බැවින් ද,

2. මෙම දැන්වීමේ පළමුවන ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස් කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15 හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේය.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ අස්වැද්දුම් ග්‍රාමයේ පිහිටි අස්වැද්දුම්වත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් සකසන ලද 1993.04.29 දින හා අංක 60/93 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ 0, ප. 16 ක්වූ කැබලි අංක 15 දරන බිම් කොටස සහ ඊට අයිති සියලු දේත් සමඟ වේ.

තවද, කැබලි අංක 13 (අඩි 15ක් පළල පාර ) මතින් ඇති මාර්ග අයිතිය ද අලකොලදෙනිය – කුරුණෑගල පාර දක්වා දිවෙන අඩි 20 පළල වෙන් කරන ලද මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 මැයි මස 09 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

06-645/4

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ දැන්වීම

2006 මැයි 18 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1. මහජන නොතාරිස් එස්. එච්. රණවක විසින් සහතික කරන ලද 1997 ජූනි 18 දිනැති අංක 1274 දරන බැඳුම්කර මත මුල් මුදල හා 2006.01.31 දින තෙක් පොළිය වශයෙන් රුපියල් විසිනව ලක්ෂ පනස්තුන් දහස් අටසිය හතරයි ශත හතලිස් නවයක (රු. 29,53,804.49) මුදලක් සමඟ රුපියල් පහළොස් ලක්ෂයක (රු. 15,00,000) මුදලක් මත වරසකට සියයට විසිඑක (21%) බැගින් පොළියක්, 2006.02.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගාල්ල, දංගෙදර, හෙන්රි පේදිරිස් මාවත, හිරිඹුර පාර, අංක 314 හි පිහිටි සිලෝන් සිනමන් ප්ලාන්ටර්ස් ඇන්ඩ් එක්ස්පෝටර්ස් සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 1274 දරන බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් විසිනවලක්ෂ පනස්තුන් දහස් අටසිය හතරයි ශත හතලිස් නවයක මුදල සමඟ 2006.02.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී අකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සහ මුදල් ද, අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 03, ධර්මපාල මාවත, අංක 55ඒ හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ අයකිරීමේ අංශයේ සම්බන්ධතා කළමනාකාරුට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### දේපල පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල මහ නගර සභා සීමාවේ, දංගෙදර හි පිහිටි හෙන්රි පේදිරිස් මාවත, වරිපනම් අංක 314 දරන ගොඩනැගිල්ල, වැව්ලි සමඟ දම්පිට්ටනියවත්ත, අද්දරඹිවිට හෙවත් ආන්ඩිතිට්ටම් *හෙවත්* ආන්ඩිවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. එල්. ඩී. අබේගුණවර්ධන විසින් සාදන ලද 1933 අගෝස්තු මස 17 දිනැති අංක 2541ඒ දරන පිඹුරේ විස්තර කළ ලොට් ඒ වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : බබායියාගේ කොරටුව *හෙවත්* පරුස්ස ඕවිට *හෙවත්* බෙල්ලන්විලඕවිට හා අගල ද, නැගෙනහිරට : අගල සහ දම්පිට්ටනියේවත්ත ද, දකුණට : එම ඉඩමේ ලොට් බී ද, බස්නාහිරට : හිරිඹුරට මහා මාර්ගය ද මායිම්ව එකී අංක 2541ඒ දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් තිස්අටයි දශම තුනක බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි සියලු දේ වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ378/222 හි ලියාපදිංචි කර ඇත.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර සහ ගාල්ල මහ නගර සභා සීමාවේ දංගෙදර හි පිහිටියාවූ ද, දැන් හෙන්රි පේදිරිස් මාවත වශයෙන් නැවත නම් කළ හිරිඹුර පාර වරිපනම් අංක 312 සහ 314 දරන ලොට් 1 වශයෙන් සඳහන් දම්පිට්ටනියේ වත්ත, අද්දර ඕවිටවත්ත *හෙවත්* ආන්ඩිතෝට්ටම් *හෙවත්* අන්ඩිවත්ත හි ලොට් ඒ වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු සී. ඩී. පොන්සේකා විසින් සාදන ලද 1977 ජූනි 04 දිනැති අංක 1754 දරන මිණුම් පිඹුරේ දැන් විස්තර කර ඇති ලොට් ඒ වශයෙන් සඳහන් එකී ලොට් 1 දරන ඉඩම් කැබැල්ල, උතුරට : දම්පිට්ටනියේ වත්ත ද, ඊසානට එම ඉඩමේ ලොට් බී ද, නිරිතදිගට : දැන් හෙන්රි පේදිරිස් මාවත යනුවෙන් නැවත නම් කර ඇති හිරිඹුර පාර ද, වයඹට : බබායියාගේ කොරටුව *හෙවත්* පරුස්ස ඕවිට *හෙවත්* බෙල්ලන්විල ඕවිට ද මායිම්ව එකී

අංක 1754 දරන පිඹුරු අනුව රූඩ් එකයි, පර්චස් විසිනවයයි දශම හතක (අ. 0, රූ. 1, පර්. 29.7) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි සියලු දේ වේ.

වී. රාජෙන්ද්‍රන්,
සම්බන්ධතා කළමනාකරු-අයකර ගැනීම්

03 වැනි මහල,
අයකර ගැනීමේ ඒකකය,
ලංකා බැංකුව,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01

06-650

---

## කොමර්පල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ්ප් සිලෝන් ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ණය ගිණුම් අංකය : 136310.

2006 ක් මාර්තු මස 30 වැනි දින පවත්වන ලද කොමර්ෂල් බැන්ක් ඔf්ප් සිලෝන් ලිමිටඩ්හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :

